චක්‍රලේඛ අංක:- 09/2006

මගේ අංකය:- ඔප/සසේකො/ලේ/ තිර.

සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක: 50, තිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.10.09

සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමූපකාර ණය දෙන සමිතිවල
සභාපතිවරුන් වෙත,

මහත්මයාණනි,

**අධ්‍යාපන සහ අනිකුත් සුදුසුකම් නොමැති තම නිසා**
**සේවයේ ස්ථිරත්වය අහිමි සේවකයින්.**

දැනට බොහෝ සමිතිවලට බඳවාගෙන ඇති සමහර සේවකයින් බඳවා ගැනීමේදී සමිති විසින් සමූපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි අනුගමනය නොකිරීම හේතු කොටගෙන එබඳු සේවකයින් වසර ගණනාවක් තිස්සේ තම තනතුරුවල ස්ථිරත්වය ලබා ගැනීමට නොහැකිව බලවත් අපහසුතාවයන්ට මුහුණ දෙමින් සිටින බව වාර්තාවේ.

02. මෙම තත්වයට මූලික වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුගමනය කර ඇති අවිධිමත් ක්‍රියා මාර්ග හේතු සාධක වී ඇති අතර, මින් ඉදිරියට සේවකයන්ට මෙබඳු තත්වයන්ට මුහුණ දීමට සිදු නොවන අන්දමින් අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා කළයුතු බව තරයේම දැනුම් දීමට මෙම කොමිෂන් සභාවට සිදුව ඇත.

03. තවත් ආකාරයකින් කරුණු විමර්ශණය කිරීමේ දී, පෙනී යන්නේ සමහර සේවකයින්ට සමිතියේ ...මකව පවත්නා යම් යම් තනතුරු වලට පත්වීම් ලැබීමට දක්වන පෞද්ගලික අකමැත්ත හේතුකොට ගෙන ...න් සභාවට පදනම් විරහිත ආයාචනා ඉදිරිපත් කරමින් පසුවන බවයි.

සේවකයින් මුහුණ දී ඇති අසහනකාරී තත්වයන් සැලකිල්ලට ගෙන එකම තනතුරක වසර තුනකට ...වයේ රැඳී ඉතා සතුටුදායක සේවයක් ඉටුකරන සේවකයින් පිළිබඳ පහත සඳහන් විස්තර එක් එක් ...ා සම්බන්ධව වෙන වෙනම ගොනු සකසා අධ්‍යක්ෂක මණ්ඩල නිර්දේශයන්ද සමඟ 2006.1[illegible].15 ...පර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි.

(01) සේවකයාගේ නම :

(02) පත් දිනය :-

(03) ඇමුණුම් වාර්තාව අංක: 01,
(පත්වීම් ලිපියේ සහතික පිටපතක්, අධ්‍යාපන සහතිකවල සහතික පිටපත්, පදිංචිය සහතික කර මේ ලප)

(04) වසර තුනක කාලයක තුළ නොකඩවා ඉටුකරනු ලබන කාර්යය විස්තරය.

(05) පැමිණීම, හැසිරීම සහ කාර්යයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය

(06) තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමූපකාර සංවර්ධන කොමසාරිස්/ සමිති රෙජිස්ට්‍රාර් ගේ ගේ අනුමැතිය හෝ වසර තුනක කාලය නොඉක්මවූ පිටිස්බල තක්සේරුව.

05. එකම තනතුරක වසර 03 ක් හෝ ඊට වැඩි සේවකාලයක් සහිත සේවකයින් පිළිබඳව මෙම චක්‍රලේඛය මඟින් යෝජිත පරිදි කටයුතු කොට අදාල සේවකයින්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා නියමිත ලිපි ලේඛණ ...න් වෙන් ගොනුකර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

(02 පිටුවට)

එක් වසරකට වැ

06. වසර තුනකට වඩා අඩු/සේවා කාලය සහිත සේවකයින්ට තනතුරුවල ස්ථිරත්වය ලබා ගැනීමට ඇති අපහසුතාවයන්ට ලිඛිතව වශයෙන් ඔවුන් දැනට දරනු ලබන තනතුරු සඳහා ඔවුනට සුදුසුකම් ඇත්, සමිතිවල අනුමත පිරිස්බල සත්සේරුවල පවතින අදාල සුදුසුකම් සහිත තනතුරු වලට එම සේවකයින් පත්කොට ඔවුනට එම තනතුරුවල ස්ථිරත්වය පිරිනැමීම කළයුතු බව කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ සඳහා එයි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවයද ලබාගෙන 2006.12.31 දින වන විට එම ක්‍රියා මාර්ගය අවසන් කිරීමට සියලුම සමිති විසින් විධිමත්ව කටයුතු කලයුතු අතර, ප්‍රමාණවත් පුරප්පාඩු නොමැති අවස්ථා වලදී සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් වෙත කරුණු දක්වමින් පිරිස්බල සත්සේරු වල පවතින අවශ්‍ය තනතුරු යටපත්කොට පෙ මෙකී සේවකයින් සඳහා පුරප්පාඩු නිර්මාණය කරගැනීමට ක්‍රියා කලයුතුය.

07. මේ අන්දමින් සුදුසුකම් රහිත සේවකයින්ට විධිමත් පරිදි තනතුරු ලබාදීමේ ක්‍රියා මාර්ගය කෙරෙහි විශේෂ අවධානය යොමු කලයුතු අතර, මෙම ක්‍රියා මාර්ගය අවසන් වන තෙක් සුදුසුකම් රහිත සේවකයින්ගේ තනතුරු ස්ථිර කර දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකලයුතු බවද, කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙමි.

08. මෙම චක්‍රලේඛය නිකුත්වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි සුදුසුකම් සපුරා නොමැති සහ කොමිෂන් සභා පූර්ව අනුමැතියෙන් තොර කිසිම සේවකයෙකු බාහිරින් හෝ අභ්‍යන්තරයෙන් තනතුරු වලට බඳවා ගැනීම නොකලයුතු බවත්, සේවකයින් බඳවා ගැනීමේදී කොමිෂන් සභා නියමයන් සහ රෙගුලාසි අනුගමනය කලයුතු බවත්, කොමිෂන් සභාව විසින් අවධාරණයෙන්ම දැනුම් දෙන අතර, 2007.01.01 දින සිට ඊට පටහැනි ඉල්ලීම් කිසිවක් සලකා නොබලන බව ද, දැනුම් දෙමි.

09. මෙම චක්‍රලේඛය පරිදි ඉදිරිපත් කෙරෙන ලිපි ලේඛන සම්බන්ධයෙන් අපැහැදිලිතා මතුවුවහොත් ඒ සම්බන්ධ ලේඛන විමර්ශනයට ලක්වනු ඇත. වසර 03 ට වැඩි සහ වසර 03 ට අඩු සේවා ගොනු වෙන වෙනම සකසා ඉදිරිපත් කරන ලෙස දැනුම්දෙමි.

10. ස්ථිර තනතුරක් දරණ එහෙත් වෙනත් තනතුරක වැඩ බලන/රාජකාරි ආවරණය කරන/රාජකාරි ඉටු කරන සේවකයින් මෙම අවස්ථා දෙකටම අදාල නැත.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාතේ සමුපකාර, පළාත් මාර්ග හා විදුලි බල අමාත්‍යතුමාගේ සම්බන්ධීකරණ නිලධාරී.
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමුපකාර හා පළාත් මාර්ග අමාත්‍යාංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම ජාතික සමිති සංගම්